# බස් එකේ හොරෙක්



B L සෙව්මිණ ගයේෂ් ලියනරත්න

# බස් එකේ හොරෙක්

B L සෙව්මිණ ගයේෂ් ලියනරත්න

කතෘ

ධර්මරාජ විද්‍යාලය - මහනුවර

6 ශ්‍රේණිය B

2026

ප්‍රකාශිත දිනය 2026-05-10

**ISBN**

# ~ පිදුම ~

මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමිය වන  ශශිකලා සේනාධීර මියටත්, ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක, සෙනෙවිරත්න මහලේකම් සර්ටත්, මහනුවර ධර්මරාජ විද්‍යාලයේ විදුහල්පතිතුමා, මධ්‍යම අංශයේ විදුහල්පතිතුමා 6-B පංතියේ පංතිභාර ගුරුතුමියටත්, අංශභාර ගුරුතුමියටත් මෙම අවස්ථාව ලබා දීමට කටයුතු කිරීම පිළිබඳව මගපෙන්වීමත් වෙනුවෙන් ගෞරවනීය ස්තූතිය.

මා ඉගනගත් ධර්මරාජ විද්‍යාලයේ අකුරු කියාදුන් සියලුම ගුරුවරුන්ට යහළුවන්ට මේ කුඩා උත්සාහයට ආදරයෙන් පිදේ..



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා  සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව



උදේ 6.05ට අපේ TD 52 දරන කහ පාට බස් එක පිරී ඉතිරී ගියා. මම හැමදාම වගේ ජනේලේ ළඟ තියෙන තුන්වෙනි සීට් එකේ ඉඳගත්තා. අදත් පොත් බැග් එක උකුලට තියාගෙන ගණිත පාඩම කටපාඩම් කර කර හිටියා. ඔය අතරේ හැමදාම අම්මා දුන්න බත් එකේ සුවඳත් ආවා..

අම්මා මට කලින් හැමදාම නැගිටිනවා.. මාව පරක්කු නොකර බස් එකට ගෙනත් දානවා...

එකේ සෙනඟ වැඩියි. 6 වසරේ ඉඳන් 13 වසර දක්වා ළමයි, ටියුෂන් යන අයියලා අක්කලා, වැඩට යන මාමලා ආච්චිලා ඔක්කොම එකට.



හදිසියේම පිටිපස්සෙන් "අනේ! මගේ පසුම්බිය නෑ!" කියලා කෑ ගැහුවා. මම බැලුවා. 11 වසරේ සුමින් අයියා මූණ සුදු වෙලා බෑග් එක පෙරළ පෙරළා බලනවා. එයාගේ කටහඬ වෙව්ලනවා. "අද උදේ තාත්තා දීපු රුපියල් 500යි, මාසෙට ගත්ත බස් සීසන් එකයි තිබුණේ. දැන් නෑ!"

එතකොටම කොන්දොස්තර මාමා බස් එක නවත්තලා "අනේ දෙයියනේ! බස් එකේ හොරෙක් වගේ. කවුරුත් බහින්න එපා. හැමෝගෙම බෑග් බලන්න වෙනවා" කිව්වා.
මගේ හිත ගැස්සුණා.



බස් එකේ හිටපු හැමෝම එකිනෙකා දිහා සැකයෙන් බලන්න ගත්තා. මගේ ළඟ හිටපු 7 වසරේ නුවන්ගේ අත වෙව්ලනවා මම දැක්කා. මට හිතුණා "උඹද හොරකම් කරේ?" කියලා. ඒත් නුවන් ගොඩක් බයයි. එයාගේ ඇස්වල කඳුළු පිරුණා. මාගේ දිහාත් කට්ටිය හොරෙක් දිහා බලනවා වගේ බැලුවා.. බුදු අම්මෝ මම හොරකම් කරලා අහු උනොත් අම්මා මාව හිරේටම බාරදෙයි.. ඒ තරහට නෙවේ. මම රටේ හොද ළමයෙක් කරන්න.. සුමින් අයියා කියනවා



"මම පසුම්බිය දැම්මේ මේ බෑග් එකේ ඉස්සරහ සාක්කුවේ. දැන් නෑ."

කොන්දොස්තර මාමා කිව්වා
"හොඳට බලන්න. බිම වැටිලා ඇති." හැමෝම තමන්ගේ සීට් එක යට, බෑග් ඇතුලේ හෙව්වා. ඒත් පසුම්බිය නෑ. බස් එකේ සෙනගට තරහා හැමෝම කේන්තියෙන්, බයෙන් ඉන්නේ. හැමෝම තමන්ගේ වැඩට යන්න වෙලා යන නිසා හොරාව හොයනවා...
මමත් මගේ බෑග් එක යට අත දාලා බැලුවා. එතකොට මගේ සපත්තුවට මොකක්දෝ තද වෙනවා දැනුණා.



මම බැලුවා.කලු පාට, පැරණි පසුම්බියක්! කොන ටිකක් ඉරිලා, ඉස්සරහේ "S" කියලා අකුරක් ගහලා තියෙනවා. මගේ හිත ගැස්සුණා. මම හයියෙන් කෑ ගැහුවා "සුමින් අයියේ! මේක නේද ඔයාගේ පසුම්බිය!"

සුමින් අයියා දුවගෙන ඇවිත් පසුම්බිය අරගෙන බැලුවා. "ඔව්! මගේම තමයි! අනේ මට හිතාගන්න බෑ කොහොමද මේක මෙතනට ආවේ" කියලා එයා කිව්වා.

කොන්දොස්තර මාමාත් හිනා වෙලා "අනේ පුතේ, ඔයා සල්ලි ගන්න වෙලාවේ බිම වැටුණා ඇති. අපි නිකන් කලබල වුණා" කිව්වා.

එතකොට තමයි මට තේරුණේ මමත් නුවන් දිහා සැකයෙන් බලලා තියෙනවා. නුවන්ගේ ඇස්වල තිබුණ කඳුළු දැන් මැකිලා. එයා ලැජ්ජාවෙන් බිම බලාගෙන හිටියා. මටත් ලැජ්ජා හිතුණා. අපි නිකන් බැලුවේ නැතිව කාටහරි හොරා කියන්න ගියානේ.

කොන්දොස්තර මාමා බස් එකේ හැමෝටම ඇහෙන්න කිව්වා "ළමයිනේ, මේකෙන් පාඩමක් ඉගෙන ගන්න. කලබල වුණාම ඇස් පේන්නේ නැහැ. බැලුවේ නැතිව කාටවත් චෝදනා කරන්න එපා. අනුමාන කරන එක වැරදියි." හැමෝම ඔලුව වනනවා.

සුමින් අයියා මගේ ළඟට ඇවිත් "තැන්ක් යූ මල්ලි. ඔයා නැත්නම් මම අද පාසලට යන්නේ නැතිව ගෙදර යන්න වෙන්න තිබුණා" කිව්වා. මම හිනා වුණා. අද අයිස් ක්‍රීම් එකක් අරන් දෙන්න ම් ඔයාට. විවේක කාලයේ අනිවාර්යෙන් එන්න..



මට මගේ යාලුවෝ ටික මතක් උනා.. ඒත් එච්චර සල්ලි තියෙයිද සුමිත් අයියා ලග...

ඊට පස්සේ බස් එක ආපහු යන්න ගත්තා. හැමෝම හිනා වෙලා කතා කරනවා.

නුවන් මගේ ළඟට ඇවිත් "සොරි මල්ලි, මම බය වුණා" කිව්වා. මම කිව්වා "කමක් නෑ අයියේ. මමත් ඔයාව සැක කළා."



එදා ඉඳන් මම බස් එකේදී හැම දෙයක්ම හොඳට බලාගෙන ඉන්නවා. හැමෝම මගේ යාලුවෝ උනා.

පාසල් ගියාට පස්සේ මම මේ කතාව අපේ පංතිභාර මැඩම්ටත් කිව්වා. මැඩම් කිව්වා "මේක හොඳ කතාවක්. අවංකමයි, ඉවසීමයි, බලාගෙන වැඩ කරන එකයි කියන දේවල් මේකේ තියෙනවා" කියලා.

එදා ඉඳන් මට තේරුණා හොරෙක් හොයනවට වඩා වැදගත් හොඳට බලාගෙන වැඩ කරන එක කියලා.
බස් එකේ ගමන දැන් මට ගොඩක් සතුටුයි. හැමදාම යාළුවෝ එක්ක කතා කර යනවා.



කලබල වුණොත් කිසිම දෙයක් හරි විදිහට පේන්නේ නැහැ කියන එක මම කවදාවත් අමතක කරන්නේ නැහැ.

එදා ගෙදර ගිහින් අම්මා ට කතාව කීවා. අම්මා ටත් හිනා. එයා එයාට උන දේවල් ගොඩක් මට කිව්වා.. මමත් අම්මා වගේ හොඳ කෙනෙක් වෙනවා..

හොඳ වැඩක් කරාම හිත සතුටු වෙනවා. ඒ සතුට තමයි ලෝකේ ලොකුම තෑග්ග...අපට අයිති නැති දෙයක් ගන්න හොඳ නෑ.. කාගේ හරි දෙයක් හොයාගත්තොත් ඒක දෙන එක තමයි හරී.

# නිමි




# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ )